# මාක්ස්වාදී දෘෂ්ටිය තුළ "සංවර්ධන සංකල්පය" අර්ථ දැක්වීම

**සේන නානායක්කාර***

'සංවර්ධනය' යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද? දැනට දසක හතඅටකට පෙර සිට සංකල්පයක් ලෙස සමාජ භාවිතයෙහි රැඳුණු වචන මාත්‍රයක් අද වන විට වඩාත් නිවැරදි අර්ථ නිරුක්තියක් දක්වා වැඩී ඇති බවක් පෙනේ. විවිධ විෂය ක්ෂේත්‍රයන්ට අනුව හා විවිධ දෘෂ්ටිකෝණයන්ට අදාළ ව මෙය විවිධාකාරයෙන් නිර්වචනය කෙරෙනු පෙනේ. විටින් විට කුළුගැන්වෙන කාලානුරූප අර්ථකථනයන් විසින්, වෙනස් වෙමින් පවත්නා එහි අරමුණු හා අභිප්‍රායයන් ද ඍජු ව මෙන් ම වක්‍රව ද නිරූපනය කරනු දැකිය හැකි ය.

ඒ කෙසේ වුව ද, වර්ධනය යනු, යම් වෘද්ධිමය ස්වභාවයක් ලෙස පිළිගැනේ. ඒ අනුව, "සං + වර්ධනය, යනු සකලවිධ යහපත් පාර්ශවයන්ගේ වැඩීමක් බව පොදුවේ හඳුන්වාදිය හැකි ය. එහි සමාජ, සංස්කෘතික, ආර්ථික, දේශපාලනික හා ආගමික ආදී වශයෙන් විවිධ වූ ක්ෂේත්‍රයන් කරණකොටගෙන කෙරෙන විභේදනය ඉතා වැදගත් වෙයි. මෙකී සංක්ෂිප්ත නිබන්ධයෙන් අරමුණු කෙරෙනුයේ, එය එක්තරා දේශපාලනික දර්ශනයක් ඔස්සේ විග්‍රහ කෙරෙන ආකාරය පෙන්වා දීම යි. දහනව වන සියවසේ ජර්මනිය ප්‍රමුඛ මුළුමහත් යුරෝපයේ සුපතළ ව, පසුකාලීන ව නව ලෝක දේශපාලන හා ආර්ථික දර්ශනයක් ලෙස මුල්බැසගත් ඓතිහාසික මාක්ස්වාදය මේ සඳහා පාදක කොට ගැනේ.

කාල්මාක්ස් හා එංගල්ස් විසින් භෞතිකවාදී දෘෂ්ටියක් උපයෝගී කොටගෙන වර්ධනය කළා වූ සංකල්පයක්, "සංවර්ධනය" නම් වූ ක්‍රියාදාමයෙහි ලා විවිධ වූ අර්ථකථන සපයයි. ඒ අනුව ඉතිහාසය පිළිබඳ ව වඩා ත් විද්‍යානුකූල අවබෝධයක් සමාජගත කරවීමෙහි ශක්‍යතා ප්‍රකට කරන බුද්ධිමය උපකරණයක් ලෙස මාක්ස් හා එංගල්ස්ගේ ඓතිහාසික භෞතිකවාදී ඉගැන්වීම් නම් කෙරේ. ඒ නිසාම "සමාජ සංවර්ධනය පිළිබඳ මාක්ස්වාදී විද්‍යාව ඓතිහාසික භෞතිකවාදය යනුවෙන් නම් කෙරේ."[1]

විවිධ දෘෂ්ටිමය මතවාදයන් අතික්‍රමණය කරන්නට එය සමත් විය. "ඉතිහාසය, දේශපාලනය, ආර්ථික විද්‍යාව, නීතිවේදය යනාදිය වැනි නිශ්චිත සමාජ විද්‍යාවන්ට පටහැනි ලෙස ඓතිහාසික භෞතිකවාදය, සමාජ සංවර්ධනයේ ස්ථිරසාර පොදු නියමයන් නිරූපණය කරයි.[2]

---

* ආචාර්ය සේන නානායක්කාර, BA (Hons.) MA , PhD (කැලණිය), අංශාධිපති, මානවශාස්ත්‍ර අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය මිහින්තලේ, sena@rjt.ac.lk, senananayakkara@yahoo.com

වඩා ත් විධිමත් විශ්ලේෂණ විධික්‍රමයක් ලෙස ඒ මගින් කුළුගැන්වෙන, මිනිසා, සමාජය හා එහි ක්‍රමික ගමන් මග ඉතා පැහැදිලි යැයි ද මානව සමාජ පරිණාමය තුළ එ බඳු විශිෂ්ට සමාජ හිතවාදී විග්‍රහයක් ඉදිරිපත් නොවී යැයි ද කියැවේ.[3]

සමාජ සංවර්ධනය පිළිබඳ මෙම ඉගැන්වීම් මිනිස් චින්තනයේ එක් ශ්‍රේෂ්ඨතම ඵලයක් ලෙස හැඳින්වෙන අවස්ථා අපමණ ය. එය නිර්ධන පන්තියේ සංකල්ප විද්‍යාව නොහොත් පරම දෘෂ්ටිය ලෙස ද හැඳින්විණි.[4] එහි ජාතික විමුක්තිය, සාමය හා සමාජවාදය ද විග්‍රහ කරන අතර එමගින් සමාජ සංවර්ධනය කෙරෙහි ගැඹුරු අවධානය යොමු කොට ඇත. සමාජ සංවර්ධනයේ යථාර්ථවාදී නියමයන් හෙළි කළ විද්‍යාත්මක කොමියුනිස්ට්වාදීහු ශ්‍රමය හා නිෂ්පාදන අයිතිය මත පදනම් වූ සංවර්ධන නිර්ණායකයන් පිළිබඳ මෙහි දී අවධාරණය කළ හ.

ශ්‍රමය හා නිෂ්පාදන අයිතිය පදනම් කොටගත් පොදු දේපළ ක්‍රමය හා සමාජ සමානාත්මතාව එහි ප්‍රමුඛාංග වෙයි.[5] නිර්ධන පන්තිවාදී විඥ්ඥාණ ධාරාවක් ඔස්සේ ගොඩනැගෙන එකී නිර්ණායකයන් කලානුරූප නොවන බව ද ඇතැමෙක් චෝදනා කරති.[6] එසේ ම ඒවා හේගල් ප්‍රමුඛ ජර්මානු දර්ශනවාදීන්ගෙන් උකහාගත් දෙයින් ගොඩනැගූ විද්‍යාත්මක අර්ථකථන ලෙස ලේබල් අලවාගත් පටු චින්තනයන් බව ද තවත් ඇතැම්හු දොස් නගති.[7]

නමුත්, මාක්ස් හා එංගල්ස් එම ප්‍රකාශයන් හි සමහර කොටස් ප්‍රතික්ෂේප කළේ නැත. හේගල් ප්‍රමුඛ ශ්‍රේෂ්ඨ ජර්මානු දාර්ශනිකයන්ට තමන් ණය ගැති බව මාක්ස් හා එංගල්ස් නිතර ප්‍රකාශ කළ හ. "ජර්මානු දර්ශනවාදය නො තිබෙන්නට විද්‍යාත්මක සමාජවාදයකුත් නො තිබෙනු ඇතැ" යි[8] පිළිගැණිනි. "ජර්මනියේ ගොවියුද්ධය" සඳහා එංගල්ස් විසින් ලියන ලද ප්‍රස්තාවනාවෙන් එය වඩා ත් තහවුරු කෙරේ.[9]

මිනිසාත්, ඔවුන්ගේ ක්‍රියාකාරීත්වය හා අන්‍යොන්‍ය සම්බන්ධතාවනුත් එක් වූ කල සමාජය ගොඩනැගේ. සමාජය පවතින්නේ, විනාශ වන්නේ හෝ වර්ධනය වන්නේ මිනිස් ක්‍රියාවලීන් පදනම් කොටගෙන යි. එමනිසා මිනිසා පවතින්නේ ත් පුද්ගල තත්ත්වයෙනි. මිනිසා ස්වකීය ජීවිතය හෝ අනාගතය ගොඩනැගීම පිළිබඳ උත්සුක වන්නේ නම් ඔහු, ඔහු ගැන ම උගත යුතු ය.

> "එනම්. මිනිසාට දැනුම අවශ්‍ය ය. කෙසේවෙතත්, මිනිසාට සමාජ සංවර්ධනයේ නීති පිළිබඳ සත්‍යාවබෝධයක් ලබාදෙන සමාජවිද්‍යාව බිහිවීමට පෙර, දීර්ඝ හා සංකීර්ණ සංවර්ධන මාවතක් මිනිස් වර්ග යා විසින් පසුකරන ලදී. එය සිදුවූයේ ක්‍රියාශීලී විප්ලවකාරී බලවේග යක් වශයෙන් නිර්ධන පන්තිය මතු වී, ජීවිතය සමාජවාදී ලෙසට යළි ගොඩනැගීමේ අරගලය ඓතිහාසික සංවර්ධනය පිළිබඳ න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීමෙන් පසුව ය. එම විද්‍යාවේ ශ්‍රේෂ්ඨ නිර්මාපකයින් වූයේ

කාල් මාක්ස් (1818-1883), ෆ්‍රෙඩ්රික් එංගල්ස් (1820-1895) හා ව්ලැද්මීර් ඉල්විච් ලෙනින් (1870-1924) ය."[10]

"සංවර්ධනය යනු විෂමතාවකින් තොර යහපත් ජීවන පැවැත්මක් කෙරෙහි ලා මනා ලෙස යොදාගත් ශ්‍රම ශක්තීන්ගේ එකතුව යි. එහි නියම වටිනාකම් හා නිශ්පාදන බලවේග තීරණය වීම සැබෑ සමාජ සංවර්ධනයේ මුල් ම හැඳිනුම් පත ය."[11] මාක්ස්වාදය තුළ "සංවර්ධනය" අර්ථ නිරූපණය වන්නේ එ පරිද්දෙනි. ඔවුහු තවදුරට ත් මෙසේ කියති.

> "ඔබ හැමදෙනා ම දිනපතා විකුණන දෙයක් නම් ඔබේ ශ්‍රමය බව ඔබ හඟිනවාට සැකයක් නැත. මේ හේතුව නිසා ශ්‍රමයට මිලක් තිබේ. භාණ්ඩයක මිල වූ කලී එහි වටිනාකමේ මුදල් ප්‍රකාශනයක් බැවින් ශ්‍රමයේ වටිනාකම වැනි දෙයක් භාවිත කිරීම පැවතිය යුතු ය. එසේ නම්, ශ්‍රම ශක්තියේ වටිනාකම යනු කුමක් ද? අනෙක් හැම භාණ්ඩයකම මෙන් ම, එහි වටිනාකම තීරණය කෙරෙන්නේ එය නිපදවීමට යන අවශ්‍ය ශ්‍රම ප්‍රමාණය විසිනි. මිනිසකුගේ ශ්‍රම ශක්තිය රඳා පවතින්නේ ඔහුගේ ජීවමාන පෞද්ගලිකත්වය තුළ ය. මිනිසකුට වැඩී ඔහුගේ ජීවත්වීම නඩත්තු කරගෙන යාමට ජීවත්වීමට අවශ්‍ය දෑ සම්භාරයක් පරිභෝජනයට ගත යුතු ය. මිනිසා ද යන්ත්‍රයක් මෙන් ගෙවී යයි. ඔහු වෙනුවට තවත් මිනිසකු ඉදිරිපත් කළ යුතු ය. මිනිසාගේ නඩත්තුවට අවශ්‍ය දෑ හැරුණු විට ඔහුට ඔහුගේ ශ්‍රම ශක්තිය දියුණු කොට නියමිත දක්ෂතාවයන් ලබාගැනීම සඳහා එක්තරා ප්‍රමාණයක් වටිනාකම් වැය කිරීමට සිදුවේ. එසේ නම්, ශ්‍රම ශක්තියේ වටිනාකම තීරණය වන්නේ ශ්‍රම ශක්තිය නිශ්පාදනය කිරීමට, වර්ධනය කිරීමට, නඩත්තු කිරීමට, සහ සදාකාලික කිරීමට උවමනා කරන අවශ්‍යතාවන්ගේ වටිනාකම් විසිනි.[12]

මේ අනුව, "සංවර්ධනය" යන්න ශ්‍රමය හා බැඳෙන අයුරු මාක්ස්වාදය තුළ දැඩි ලෙස අවධාරණය කෙරේ. සියලු ධනයේ මූලාශ්‍රය ශ්‍රමය බව එහි සඳහන් ය. ස්වභාවධර්මය හැරුණු විට ධනය බවට පරිවර්තනය කෙරෙන ද්‍රව්‍ය සපයන වැදගත් ම මූලාශ්‍රය ලෙස ශ්‍රමය හැඳින්වේ. නමුත් එය ස්වභාවධර්මයට ත් වඩා අපරිමිත වන අතර සකලවිධ මානව පැවැත්මේ ප්‍රථම ප්‍රධාන පදනම ද වෙයි. එ බැවින් මාක්ස්වාදය පෙන්වා දෙන්නේ තිරිසන් සත්ත්වයකු ශිෂ්ටාචාරවත් මානවයකු බවට පත් කරමින් ශ්‍රමය විසින් කරන ලද කාර්යය සංවර්ධනයේ මුල් ම ප්‍රවේශය බව යි. එ බැවින් සමාජ සංවර්ධනය අර්ථ කථනයෙහි ලා මාක්ස්වාදය මේ වැදගත් කරුණ හෙළි කරයි.

"ශ්‍රමය විසින් මිනිසා බිහිකරන ලදැ යි අප අවධාරණය කරන්නෙමු."[13]

කාල් මාක්ස් ගේ හා ෆ්‍රෙඩ්රික් එංගල්ස් ගේ භෞතිකවාදී දාර්ශනික සංකල්පය තුළ සංවර්ධනය විෂයයෙහි ලා වෙන් කෙරුණු ඉඩ වඩා ත් පුළුල් යැයි ප්‍රකාශ කරනුයේ, වඩා ත් ගැඹුරු ප්‍රායෝගික න්‍යායවාදයක් ලෙස එය ව්‍යාප්ත වන බැවිනි.

මේ අනුව, කාල්මාක්ස් සමාජය විග්‍රහ කිරීමෙහි ලා උපයෝගී කොටගත් දෘෂ්ටිය ආර්ථික නියතිවාදයක් (Economic Determinism) ලෙස ද හඳුන්වා දිය හැකි යි.[14] සමාජයේ සෑම දෙයක් ම පවත්නේ හා ක්‍රියාත්මක වන්නේ හුදෙක් ආර්ථික පදනමක් මත බව එයින් කියැවේ.

උක්ත ආර්ථික නියතිවාදයට අනුව, නිශ්පාදන මාධ්‍යයේ හිමිකරුවන් නිසා සමාජයක නිශ්පාදන කාර්යයේ ස්වභාවය තීරණය කෙරේ. පොදු සමාජයේ අරමුණු හා අපේක්ෂාවන්ට අදාළ නො වන පරිදි එවිට එහි ආර්ථික සම්බන්ධතා සකස් වෙයි. ගොඩනැගෙයි. එසේ වන්නේ, නිශ්පාදන හිමිකරුවන්ගේ අභිමතාර්ථයට ගැලපෙන පරිද්දෙනි. අනතුරු ව, එහි ආර්ථිකය පමණක් නොවේ, දේශපාලනය, සංස්කෘතිය, ආගම, අධ්‍යාපනය, නීතිය හා කලාව ආදී සෑම අංශයක් ම හැඩගැසෙන්නේ එකී පන්තියේ සිතැඟියාවනට අනුකූල ව ය. ඒ අනුව, සමාජ සංවර්ධනය විෂයයෙහි ලා කාල්මාක්ස් ආර්ථික නියතිවාදියෙකු (Economic Determinist) ලෙස හැඳින්වීම යුක්ති යුක්ත වෙයි.

එ පමණක් නොවේ. එහි ලා සමාජය විග්‍රහකිරීමේදී මාක්ස්වාදය අනුදත් විග්‍රහාත්මක සිද්ධාන්තය වූයේ ප්‍රවාදය, ප්‍රතිවාදය හා සහවාදය යි. (Thesis, Anti-Thesis and Syn-Thesis) යථෝක්ත ආර්ථික නියතිවාදය ම ප්‍රතිෂ්ඨා කොටගෙන මාක්ස් විසින් භාවිත මේ සිද්ධාන්තයෙන් කියැවෙන්නේ සමාජ සංවර්ධනයේ ත්‍රිවිධාකාර පියවර පිළිබඳ ව යි. ආර්ථික නියතිවාදයක් වුව එය සමාජවිද්‍යාත්මක දෘෂ්ටියෙන් විග්‍රහකිරීමේ දී මහාචාර්ය නන්දසේන රත්නපාල ඒ සඳහා භාවිත කරනුයේ මෙ බඳු හඳුන්වාදීම කි.

> "සමාජයක් ආරම්භ වූ විට ධනෝපායන මාර්ග අයත් හා ඒවා අහිමි වැඩ කරන ජනතාව එකඟත්වයකට පැමිණ වැඩ කරති. මෙය ප්‍රවාදය යි. ඉක්බිති ව ධනවත් පංතිය තරගයකට ධෛර්ය දී හැකිතාක් අඩු වැටුපට කම්කරුවන් ලබා ගනී. ඔවුන්ගේ අතිරික්ත, ශ්‍රමය වශයෙන් ධනපතියාට ලැබේ. මෙතැන ඇත්තේ ප්‍රතිවාදය කි. මෙය කෙසේ හෝ විසඳී සහවාදයක් විය යුතු ය. මෙය සිදුවන්නේ වැඩකරන ජනතාව තමන්ගේ පංතිය පිළිබඳ හැඟීමෙන් වර්ධනය වී ධනවත් පංතිය පෙරළා දමා පංති රහිත සමාජයක් බිහිකිරීමෙනි.[15]

ශ්‍රමය හා බැඳුණු නිෂ්පාදන අයිතිය ද, දේපළ ද ඒ සියල්ල පදනම් කොටගත යුතු සමානාත්මතාව ද සහිත ව නිර්ධන පංතියේ උත්තරීතර ජයග්‍රහණය ත්, ධනපති පංතියේ පරාජය ත් මින් අර්ථවත් කෙරේ.[16]

මෙහි දී "ධනපති පන්තිය යනුවෙන් අදහස් කරන්නේ සාමාජයික නිෂ්පාදන මාධ්‍යයන් හි අයිතිකරුවන් වූ ද, වැටුප් ශ්‍රමිකයන් සේවයට යොදවන්නවුන් වූ ද නූතන ධනපතීන්ගේ පන්තිය ය. නිර්ධන පන්තිය යනුවෙන් අදහස් කරනුයේ තමන් සතු නිෂ්පාදන මාධ්‍යයන් රහිත වීම නිසා ජීවත් වනු පිණිස ස්වකීය ශ්‍රම ශක්තිය විකිණීමේ තත්ත්වයට වැටී සිටින නූතන ශ්‍රමිකයින්ගේ පන්තිය ය.[17]

උක්ත අර්ථ කථනයන්ට අනුව, සංවර්ධනය පිළිබඳ මාක්ස්වාදී චින්තනය සෙසු අංග සූත්‍රයන්ට වඩා බෙහෙවින් වෙනස් වෙයි. "මාක්ස්වාදය වැටුප් වහල් ක්‍රමයට විරුද්ධ ව අනුකම්පා විරහිත යුද්ධයක් ප්‍රකාශ කොට ඇත්තේ ය. වැටුප් වහල් ක්‍රමය පවත්නා සමාජයක, විද්‍යාව අපක්ෂපාතී වෙති යි බලාපොරොත්තු වීම මුග්ධ බොළඳ ක්‍රියාවක්" බව එහි ඉගැන්වීම යි.[18]

එකී පූර්විකාව කරණකොටගෙන එළැඹිය හැකි අවසන් ප්‍රවේශයක් වෙයි. එනම්, මාක්ස්වාදී දර්ශනවාදය ත්, දේශපාලන ආර්ථික විද්‍යාව හා විද්‍යාත්මක කොමියුනිස්ට්වාදය පිළිබඳ න්‍යායය ත් විසින් ප්‍රතිරූපණය කෙරෙන සංවර්ධනරූපී සමාජවාදී සමාජයේ පිළිබිඹුව යි. ප්‍රස්තුත සමාජ සංවර්ධන විෂයයෙහි ලා වඩා ත් වැදගත් වන කරුණු ඉන් සාක්ෂාත් කෙරෙන බව පැවසේ.

"සමාජවාදී රටවල ස්වභාව නිරූපී අංග ලක්ෂණය වන්නේ නිෂ්පාදන මාධ්‍යයන් පොදු අයිතියට යටත් ව තිබීම යි. එයින් සහයෝගිතාවයේ සම්බන්ධකම් ජනිත කෙරන අතර, මිනිසා විසින් මිනිසා සූරාකෑම අහෝසි කෙරේ. ධනවාදය සමග සසඳන කල සමාජවාදය සමාජ සංවර්ධනයේ උසස් ම අවධිය කි. එය බිහි වූයේ සමජවාදී විප්ලවවල ත්, ඉන්පසුව ඇති කරන ලද සමාජ දේශපාලනමය හා සංස්කෘතික පරිවර්තනයන්ගේ ත් ප්‍රතිඵල වශයෙනි."[19]

උක්ත න්‍යායයික චින්තනය හා ප්‍රායෝගික ඉතිහාසය ද සාපේක්ෂ ව ගලපාලමින් මාක්ස්වාදී දෘෂ්ටිය තුළ සංවර්ධනය සම්බන්ධයෙන් වූ අර්ථකථනය මෙලෙස කැටි කොට දක්වමු.

"ශ්‍රමය, නිෂ්පාදිතය හා නිෂ්පාදන අයිතීන් සමාන ව බෙදීයාමෙන් මිනිස් සමාජය තෘප්තිමත්වීම යනු සමාජවාදී සමාජයේ සංවර්ධනරූපී යථාර්ථය යි."[20]